# ලයියට පිළිතුරු - 4

ජ.වි.පෙ. සැඟවුණු ඉතිහාසයෙන් බිඳක්, හද රිදවන මතක සුවඳ නමින් වූ ලිපි පෙළක් මගින් මා ලියූ පොතට “සන්නස” පැනය මගින් පිළිතුරු සපයන ලයනල් බෝපගේ සහෝදරයාගේ අපූරුම ලිපි දෙක අංක 5-6 යටතේ 2009 ජන: පෙබ: සන්නස පත්‍රවල පළවෙයි.

ලයියා මෙතෙක් පළකරවූ ලිපිවල නැවත නැවත අවධාරණය කර ඇත්තේ මා ලියූ පොත පක්ෂයේ “අභ්‍යන්තර ඕපාදූප” මත පදනම්ව ලියූවක් බවයි. මගේ පොතේ ඇති සියල්ල වැරදි සහගත අසත්‍ය කරුණු බව එය කියවන්නන්ට ඒත්තු ගැන්වීම ඔහුගේ අභිප්‍රාය හා උපක්‍රමයයි. වෙනත් අය ගැන සඳහන් කරුණු අසත්‍ය බව පුන පුනා කීමෙන් මා බෝපගේ සහෝදරයා සම්බන්ධයෙන් ලියා ඇති දේවල්ද ඉබේම බොරුවන බව ඔහු සිතන්නට ඇත. එහෙත් පුදුමයටත් හාස්‍යයටත් කරුණ නම් ලයියා ලියන දෙයින් මා ලියා ඇති කරුණු තහවුරු කර සත්‍ය බව ඔප්පු වීමයි.

පක්ෂයේ ගමන් මගට බලපෑමක් කළ “වත්තල මොරීන්” නම් වූ චරිතයක් ගැන මම ලියා ඇත්තෙමි. ජ.වි.පෙ. ඉතිහාස කථා පළව ඇති කිසිම කෘතියක, පුවත්පතක “වත්තල මොරීන්” නම් වූ කාන්තා චරිතයක් ගැන සඳහන්ව නැත. ජ.වි.පෙ. වර්තමාන සාමාජිකයෝද එවැන්නියක් ගැන අසා නැති බව සහතිකය. එවැන්නියක් සිටි බව ලයියා තහවුරු කරයි. එපමණක් නොව මා ලියා ඇති දෙයටත් වඩා ආන්දෝලනාත්මක වූ ද, බරපතල වූ ද, සාහසික වූ ද හෙළිදරව්වක් කරයි.

බෝපගේ සහෝදරය, ඔබ “මධ්‍යස්ථානය” යන්නෙහි තේරුම දන්නවාද? නායකයන් යන එන, පණිවුඩ හුවමාරු වන තැනක් යනු සාමාන්‍ය තැනක් නොවේ. විශේෂ තැනකි. මොරීන්ගේ නිවසේ දේශපාලන මණ්ඩලයේ රැස්වීමක් පවත්වා ඇති බව මම ලියා ඇත. ඔබත් එයම ලියන්නේ ඇයි?

රෝහණ සහෝදරයා හා වත්තල මොරීන් අතර පැවතියා වූ අනියම් සම්බන්ධතාවයක් ගැන බරපතල හෙළිදරව්වක් කරන ලයියා තමා කරන්නට යන සාහසික ක්‍රියාවේ භයානක බව අඩු කර ගැනීමට, තමාගේම මනස රවටා ගෙන ධෛර්යය වඩවා ගැනීමට පූර්ව ප්‍රකාශයක් කරයි. එය මෙසේයි.

............... නිල වශයෙන් හෝ නොනිල මට්ටමින් හෝ ඕපාදූප ගැන කථා කරමින් ජ.වි.පෙ. ට හෝ ඊට සම්බන්ධ පුද්ගලයන්ට මඩ ගසන්නට මට අවශ්‍ය වූයේ නැත. එවැනි චරිතයක් වීමට අවශ්‍ය වූයේ නම් රටේ පාලක පන්තියෙන් මටතරම් අවස්ථාවක් අන් කවරෙකුටවත් ලැබුණේ යැයි මම නොසිතමි. අදටත් එවැනි චරිතයක් වන්නට මට අවශ්‍ය නැත.

අහෝ! බෝපගේ සහෝදරය, එදා ගැහුවත් අද ගැහුවත් මඩ නම් මඩමය. එතැන ඇත්තේ කාල පරාසය පිළිබඳ වෙනස පමණී.

ලයියාගේ හෙළිදරව්වට සුජාතභාවයෙන් ලබාදෙනු පිණිස ඔහු ජ.වි.පෙ. සිටියදී දරණ ලද්දාවූ නිලතලවල දීර්ඝ ලැයිස්තුවක් ඉදිරිපත් කරයි. අන් සියල්ල කෙසේ වෙතත් ඔහු “RED POWER” ඉංග්‍රීසි පුවත්පතේ කතුවරයා නොවේ. වගකීම් දැරූ භාරකරු නම් විය හැකිය. රෙඩ් පවර් පත්තරයට ලිපි සම්පාදනය කරවා ගත්තේ, සිංහල ලිපි ඉංග්‍රීසියට පරිවර්තනය කරවා ගත්තේ ඉංග්‍රීසි භාෂාවේ නිපුණතාවය ඇති හිතවතුන් හා හිතවතියන් යොදවා ගැනීමෙනි. රංජිත් පෙරේරා හා සුනිලා අබේසේකර එම කාර්යයෙහි යොදවා ගත් බව ලයියාම කියයි. අවසන් කාලයේ රෙඩ් පවර් පත්‍රය මුල පටන් අග දක්වාම සකස් කරන ලද්දේ මවිසින් පක්ෂයට හඳුන්වා දුන් මගේ කළණ මිත්‍ර මාලිංග වීසිනි. ජ.වි.පෙ. ......... පොතේ 11 වැනි ලිපිය මාලිංග ගැනය. පුවත්පතක කර්තෘ නම් අඩුම තරමින් “කර්තෘ වාක්‍යය” වත් ලිවිය යුතුය. එහෙත් රෙඩ් පවර් පත්‍රයේ කර්තෘ වාක්‍යය ලිව්වේද මාලිංග බව මට නිබයවම පැවසිය හැකිය.

කොටියාට පෙර වළහා පැනීම, හොරාට පෙර කෙහෙල් කැන වැට පැනීම යන උපමා දෙකක් අපේ ජන වහරේ තිබේ. “රෝහණ – මොරීන් අනියම් ඇසුර” නමැති කැත හෙළිදරව්වෙන් රෝහණ විජේවීරගේ දැවැන්ත ප්‍රතිරූපයට දැන දැනම දැවැන්ත යකුළු පහරක් එල්ල කරන ලයියා පහත සඳහන් ඔහුගේ වාක්‍යයෙන් ඉහත සඳහන් උපමා දෙක සිහි ගන්වන හැටි බලන්න. “මම මෙම කරුණු හෙළිදරව් කිරීමේ අරමුණ සත්‍යය පැහැදිලි කිරීම මිස රෝහණ සහෝදරයාගේ ප්‍රතිරූපයට කිසිදු අයුරකින් හානියක් කිරීම නොවන බව ඉඳුරා සඳහන් කළ යුතුයි.”

“ මළවුන් සාක්ෂි නොදෙති ” යනු ප්‍රසිද්ධ කියමනකි. (නවීන තාක්ෂණය අනුව මෙම කියමන වෙනස් වී ඇති බව සැබෑය.) “රෝහණ සහෝදරයා මොරීන් සමඟ මෙවැනි සම්බන්ධයක් ස්ථිර ලෙසම පවත්වා ගෙන ගිය බව දේශපාලන මණ්ඩලයට දැන ගැනීමට ලැබුණේ රෝහණ සහෝදරයා උපතිස්ස ගමනායක හා වාස් තිලකරත්න යන දේශපාලන මණ්ඩල සගයින් සමඟ ඒ ගැන කරන ලද ඉතාමත් පහත් පෙළේ සවිස්තරාත්මක සඳහන් නිසා බව ලයියා පවසයි. රෝහණ-ගමනායක-වාස් යන තිදෙනාම දැන් මළවුන් අතරය. එබැවින් ඔවුහු සාක්ෂි නොදෙති. එහෙත් සෝමවංශ අමරසිංහ සහෝදරයා තවමත් ජීවතුන් අතරය. ඔහු මේ ගැන කුමක් කියත්දැයි මම නොදනිමි.”

පාසැල් යන කාලයේද ඉන් පසුව ගත කරන තරුණ වියේද කයිවාරු, පම්පෝරි, අතිශයෝක්ති ගසන-කියන කොල්ලෝ එමට සිටිති. “මම අර බඩුව එක්ක සෙට් උනා. අතිනුත් ඇල්ලුවා. මූණත් ඉම්බා. අර වැඩෙත් කළා.” ඔවුහු කියති. ලයියා මේ කියන්නේ රෝහණ සහෝදරයා එවැනි බාල බොළඳ පහත් තත්ත්වයකට වැටුණ බවද? අතිශය විනය විරෝධී රහසිගත අපචාරයක යෙදෙමින් තමන්ම තමන් පාවාදී ගත් බවද?

මේ ජේ.ආර්. ගේ මර්ධන රජය තිබූ කාලයයි. නායකයන්ගේ කාර් පාවිච්චිය ගැන මම මූලස්ථානයෙන් ලිඛිතවම ප්‍රශ්න කළ කල ලද එක් පිළිතුරක් වූයේ නායකයන්ගේ ජීවිත ආරක්ෂාවද කාර් පාවිච්චි කිරීමට එක් හේතුවක් බවයි.

රෝහණ සහෝදරයා මොරීන් හමුවීමට ගියේ රියැදුරු හා ආරක්ෂකයන් සමඟද? තමාම වාහනය පදවාගෙන තනිවමද? එසේනම් නායක මණ්ඩලයේ ආරක්ෂාව සම්බන්ධයෙන් ප්‍රධාන ලේකම්වරයාද වන බෝපගේ සහෝදරයාට තිබූ සාමූහික වගකීමේ ඔහුගේ කොටස ඉටුකර ඇති අයුරු අපූරුය. ඊළඟට ඔබගේ “විප්ලවවාදී ඉවට” මේ රහස් ගමන් අහු උනේ නැද්ද? ඔබ මේ කියන්නේ ඇත්තක් නම් ජ.වි.පෙ. පහළ කමිටු සාමාජිකයන් අති දුෂ්කර ජීවිත ගෙවමින් අත්තකිලමථානු යෝගීව තරකර දෙන පක්ෂ අරමුදලින් නායකයන් සැප විඳිමින් කාමසුඛල්ලිකානු යෝගී ජීවිත ගතකර තිබේ. එම පාපයෙන් ඔබ පමණක් නිදොස් වන්නේ නැත. මන්ද එම වගකීමේ ලයියාද කොටස්කරුවෙකි. අනෙක් ප්‍රධානම කරුණ ලයියා දෙමළ ජනතාවගේ වෙන්වීමේ අයිතිය ගැන පක්ෂය තුළ අරගල කර ඇතිවා මිසක නායකයන්ගේ (එක් අයෙකුගේ නොවේ) විනය විරෝධී ක්‍රියා ගැන අරගල කර නැත. යම් හෙයකින් ලයියා පක්ෂයෙන් ඉල්ලා අසුවූයේ නායකයන්ගේ මෙම අපචාර ක්‍රියා හේතුවෙන් නම් ලයියා අද ගෞරවාන්විත හිටපු නායකයෙකි.

රෝහණ සහෝදරයා ගැන විනය පරීක්ෂණ පැවැත්වීමට ජ.වි.පෙ. දේශපාලන මණ්ඩලය සැළකිල්ලට ගන්නා ලද ප්‍රධාන කරුණු දෙකින් එකක් වන්නේ බෝපගේ සහෝදරයාගේ ප්‍රධානත්වයෙන් පවත්වන විනය පරීක්ෂණයේ තීරණය රෝහණ සහෝදරයා පිළිගනු ඇතැයි අන් දේශපාලන මණ්ඩල සාමාජිකයින්ගේ විශ්වාසය වීමය. මෙය කියන්නේ ලයියාමය. අඳෝමැයි ! රෝහණ සහෝදරයා, ලයියා හැර දේශපාලන මණ්ඩලයේ අන් සාමාජිකයන් ගනන් නොගන්නා ඔවුන් තඹයකට මායිම් නොකරන දඩබ්බරයෙකි. අත්තනෝමතික ඒකාධිපති නායකයෙකි. බහුතරයේ එකඟතාවය පිළිගත යුතු ප්‍රතිපත්තියක් ඇති පක්ෂයක නායකයා බහුතරයේ තීරණය නොපිළිග නී නම් දේශපාලන මණ්ඩලයක් පවත්වා ගෙන ගියේ මොකටද? ලයියා එම පක්ෂයේ ප්‍රධාන ලේකම්කම දැරුවේ කුමකටද? ලයියාගේ ඉහත ප්‍රකාශය නම් දේශපාලන මණ්ඩලයේ එදා සිටි පිරිසට දැනුවත්ව කළ අපහාසයකි. ඔවුන් නිකම්ම නිකම් පඹයින් ගණයට දමා හෑල්ලු කිරීමකි.

එම ප්‍රධාන කරුණු දෙකින් ලයියා සඳහන් කරන 1 වැනි කරුණ මොරීන් විසින් විනය පරීක්ෂණයක් පවත්වන ලෙස පක්ෂයෙන් ඉල්ලා සිටීමයි. මෙම ඉල්ලීමම විශාල සැකයකට හේතු වන්නේ නැද්ද? ලයියාම සඳහන් කර ඇති තොරතුරු අනුව මොරීන් විවාහක කාන්තාවකි. ඇයගේ සැමියාද පක්ෂයේ ක්‍රියාකාරිකයෙකි. තම බිරිඳගේ අනියම්

35 වන පිටුවට

රෝහිත මුණසිංහ

Migration Solutions

Are you, your friend or your relative seeking solutions for....?

- Students visa issues
- Family migration(parent, spouse etc)
- Skilled Migration (Onshore and Offshore)
- Visitor visa
- Visa cancellations issues (MRT Reviews)

Honest, reliable service assured, at affordable rates.

Call: 61 3 9547 3022



MIA
Member of Migration Institute of Australia

Manoj Dodamgoda

Grad.Cert. (Immi. Law), BIT
Member of Migration Institute of Australia
MARN: 0854504

AUSGATE
Migration Consultancy Services

No. 9/61-63 Buckley Street, Noble Park, Victoria 3174, Australia
Tel: 61 3 9547 3022 Mob: 61 430 642 774 Fax: 61 3 9547 3022
Email: manoj@ausgatemig.com.au